# පැරණි ශ්‍රී ලාංකේය භික්ෂු සමාජයේ වැඩ සිටි රහතන් වහන්සේලා පිළිබඳව පාළි අට්ඨකථා ඇසුරෙන් කරනු ලබන ඓතිහාසික විමසුමක්

## (ක්‍රි.පූ. තෙවන සියවසේ සිට ක්‍රි.ව. දෙවන සියවස තෙක්)

**- ආධුනික කථිකාචාර්ය කලුන්දෑවේ චන්දවිමල හිමි**

### හැඳින්වීම

පැරණි ශ්‍රී ලාංකේය සමාජය තුළ පැහැදිලි වශයෙන් ම ගිහි, පැවිදි වශයෙන් සමාජ කණ්ඩායම් දෙකක් හඳුනාගත හැකිය. ඒ අතුරින් පැවිදි සමාජය[1] උපසපන්, සාමණේර, මධ්‍යම, නවක, ස්ථවිර, මාර්ගඵල ලාභීන්, නිවන් අපේක්ෂා පෙරදැරිව කටයුතු කරන පිරිස් ආදි වශයෙන් විවිධ පුද්ගලයින් රැසකින් සමන්විත සංස්ථාවක් වෙයි. ක්‍රියාකාරී සමාජ කණ්ඩායමක් වශයෙන් එම පිරිස ගිහි සමාජයට ආගමානුකූල ජීවිතයකට උපදෙස් දෙන අතර සිය විමුක්තිය සලසා ගැනීම සඳහා ද කටයුතු කරති. ඉහත සඳහන් කළ ආකාරයට පැවිදි සමාජය තුළ විවිධ තත්ත්වයන් නියෝජනය කරන භික්ෂු පිරිස් ඇති අතර මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරනු ලබන්නේ එම භික්ෂු සංස්ථාව තුළ සුවිශේෂිත පිරිසක් වශයෙන් සැලකෙන රහතන් වහන්සේලා පිළිබඳව අධ්‍යයනය කිරීමටය. ඒ සඳහා භාවිත කරන ප්‍රධාන මූලාශ්‍ර පාර්ශ්වය වනුයේ පාළි අට්ඨකථාය. පාළි අට්ඨකථා යනු ත්‍රිපිටක පාළියට කරන ලද අර්ථ විවරණයකි.[2] ක්‍රි. ව. පස්වන සියවසේ සිදු කළ අර්ථ විවරණය[3] තුළ ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය නියෝජනය කළ රහතන් වහන්සේලා සම්බන්ධව තොරතුරු බොහෝමයක් අන්තර්ගතව පවතී. එම තොරතුරු මෙරට අනෙකුත් මූලාශ්‍රය සමඟ සංසන්දනාත්මකව විමසමින් ශ්‍රී ලාංකේය පැවිදි සංස්ථාව තුළ වාසය කළ භික්ෂූන්

22 FEB 2016

වහන්සේලාගේ චරිත තුළ දක්නට ලැබෙන සුවිශේෂිත ගති ලක්ෂණ හා හැකියාවන් කවරේද යන්නත් එම චරිතයන්ට සමාජය තුළ හිමිව තිබූ තත්ත්වයන් කවරේද යන්නත් මෙයින් අධ්‍යයනයට ලක් කෙරේ.

❖ රහතන් වහන්සේලාගේ චරිතවල දක්නට ලැබෙන ගති ලක්ෂණ හා හැකියාවන්

මෙරට භික්ෂු සමාජයේ ආරම්භය සිදු වනුයේ මූලාශ්‍රය තොරතුරුවලට අනුව බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස්හය වැන්නේ දී ය.[4] එය මිහිඳු හිමියන්ගේ පැමිණීමත් සමග සිදු වන අතර එතැන් පටන් මෙරට භික්ෂු සමාජය බෞද්ධ දර්ශනයට අනුකූලව සිය ජීවිත හැඩගස්වාගන්නට විය. පැවිදි ජීවිතය පිළිබඳ මනා අවබෝධයක් ලැබූ පැරණි ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය තම පැවිදි ජීවිතය මස්තකප්‍රාප්ත කර ගැනීම සඳහා ධර්මානුකූල මාවතක ගමන් කළ බවට නිදසුන් රැසක් අටුවා මූලාශ්‍රය තුළ අන්තර්ගතව තිබේ. උන්වහන්සේලා සිය පැවිදි ජීවිතය සඵල කර ගැනීම සඳහා මහත් වූ වෑයමකින් කටයුතු කළ බව මූලාශ්‍රය සාක්ෂි සපයයි. ඇතැම් භික්ෂූන් වහන්සේලා ක්ෂණයකින් රහත් බව ලබන විට තවත් පිරිසක් එම තත්ත්වය ලබා ගැනීම සඳහා කටුක පිළිවෙත් අනුගමනය කළ බව පෙනේ. ඒ අනුව මෙරට භික්ෂු සමාජය තුළ වාසය කළ මහරහතන් වහන්සේලා හා උන්වහන්සේලාට පැවිදි සමාජය තුළ මෙන්ම ගිහි සමාජය තුළ හිමිව තිබූ තත්ත්වය කවරේද යන්න මෙහිදී විමසුමට බඳුන් වෙයි.

පැරණි ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය තුළ පැවිදි ජීවිතය ආගමානුකූලව සකසාගත් මහරහතන් වහන්සේලා රැසක් වැඩ සිටිය බවට අටුවා මූලාශ්‍රවලින් තොරතුරු හමුවේ. ක්‍රි. පූ. තෙවන සියවසේ සිට ක්‍රි. ව. දෙවන සියවසේ මුල් භාගය තෙක් උන්වහන්සේලා සම්බන්ධ විස්තර අටුවා මූලාශ්‍රයවල සඳහන්ව තිබේ. අටුවා මූලාශ්‍රය තුළින් හෙළිවෙන කරුණුවලට අනුව වසභ



රජතුමාගේ අවධියේදී ද මෙරට රහතන් වහන්සේලා වැඩසිටිය බවට තොරතුරු හමුවේ.[5] දුටුගැමුණු රජු ඉදි කළ රුවන්වැලි මහ සෑ ධාතු නිධාන උත්සවයට අනූහය කෝටියක් වූ රහතන් වහන්සේලා වැඩිය බව වංසකථාවේ සඳහන් වෙයි.[6] අටුවා විස්තරයකට අනුව මහසෑය දැකීමෙන් ඇති කරගත් ප්‍රීතිය නිසා මහාවිහාරයේ දකුණු දොරටුවේ වැඩ සිටි භික්ෂූන් වහන්සේලා තිස් දහසක් රහත්ව තිබේ. එසේ ම බටහිර, උතුර හා නැගෙනහිර දොරටුවල සිටි භික්ෂූහු එපමණ පිරිසක් ද රහත් වූහ. එසේම 'පඤ්හමණ්ඩපයේ, අභයවාපියේ, ථූපාරාමයේ' නගරයට දකුණු දොරටුවේ හා අනුරාධ වැව් බැම්මේ වැඩ සිටි භික්ෂූහු ද රහත් බවට පත්වූහ.[7] මෙයට අමතරව 'මලියදේව' මහරහතන් වහන්සේ විසින් දේශනා කළ 'ඡජක්ක' සූත්‍ර දේශනාව ඇසූ දිවයිනේ බොහෝ භික්ෂූන් වහන්සේලා රහත් භාවයට පත් වූ බව අටුවා විස්තරයකින් පැහැදිලි වෙයි.[8] අටුවාවේ එන විස්තර හා වංසකථාවේ එන විස්තර සැසඳීමේදී සංඛ්‍යාවල කිසියම් ආකාරයක අවිශ්වසනීය බවක් දක්නට ඇත. තත් අවධියේ මෙරට වාසය කළ ජනගහණය හා සැසඳීමේදී මෙහි අතිශයෝක්ති බවක් ඇති බව නම් සත්‍ය වූ දෙයකි. අපට එම ගණන් ඒ ආකාරයෙන් ම පිළිගත නොහැකිය. නමුත් තත් මූලාශ්‍රවල සඳහන්ව ඇති ගණිත සංඛ්‍යාවල අතිශයෝක්ති බව නොතකා හැර බැලූ කල පැරණි ශ්‍රී ලංකාවේ බොහෝ රහතන් වහන්සේලා වැඩ සිටිය බව නම් පැහැදිලිය.

භික්ෂු සමාජය තුළ දක්නට ලැබෙන විවිධත්වය සිත් ගන්නා සුළු අතර රහතන් වහන්සේලාගේ රහත් බව ලැබීම ද ඒ ආකාරයෙන් ම සුවිශේෂිත වෙයි. ක්ෂණයකින් ධර්මය පිළිබඳව ඇති කරගත් අවබෝධය නිසා ඇතැම් භික්ෂූහු රහත් බව ලැබූහ. මහාසංඝරක්ඛිත හිමි ක්ෂණයකින් රහත් බව ලැබූ ථෙර නමකි. උපසම්පදාවෙන් සැටවස් වූ උන්වහන්සේ මරණ මඤ්චකයේ වැඩ සිටියේ, උපස්ථායක තරුණ භික්ෂුවගේ ඉල්ලීම පරිදි ක්ෂණයකින් රහත්භාවයට පැමිණියහ.[9] මෙයින් රහත් බව ලැබීම

සුළු දෙයක් යැයි නොකිය වෙයි. එවැනි තත්ත්වයක් ලැබීමට තරම් එම භික්ෂූන් වහන්සේලාගේ බුද්ධිය හා අවබෝධය වැඩි දියුණු වී තිබුණු බව එයින් පසක් වෙයි.

මෙරට භික්ෂූන් වහන්සේලා විවිධ තේමා පදනම් කරගෙන රහත් බව ලැබූ බවට නිදසුන් රැසක් අටුවාවල සඳහන්ව තිබේ. එයට කදිම නිදසුනක් වනුයේ සිංහල ගී අසා රහත් වූ සැට නමක් වූ භික්ෂූන් වහන්සේලාගේ කථා වස්තුවයි. එහි සඳහන් වන ආකාරයට භික්ෂූන් වහන්සේලා මාර්ගයේ වඩින විට 'ජරා මරණ සංයුත්තය' පිළිබඳව සිංහල ගී පෙළක් ගායනා කරනවා ශ්‍රවණය විය. ඒ පිළිබඳව සිත යොමු කළ බොහෝ භික්ෂූහු රහත් වූහ.[10] මේ ආකාරයෙන් ම තවත් භික්ෂූන් වහන්සේ නමක් විලක බැස නෙළුම් කඩන දැරියක විසින් කියන ලද ''පාතො ඵුල්ලිතකොකනදං සුරියාලොකෙන තජ්ජීයතෙ'' නම් ගාථාව ශ්‍රවණය කරමින් භාවනාවට සමවැදී රහත් වූ බව පැවසේ.[11] එසේම මල්ලක තෙරුන් වහන්සේ රහත්වීම සඳහා සුළු නිමිත්තක් උපයෝගි කරගෙන තිබේ.[12] චේතියගිරියේ මහාතිස්ස හිමියන් රහත් බව ලැබුවේ කාන්තාවකගේ නරක් වූ දතක් අරමුණු වශයෙන් ගෙනය.[13] මෙම සිදුවීම්වලින් පෙන්නුම් කරනුයේ බොහෝ භික්ෂූන් වහන්සේලා බෞද්ධ දර්ශනය පිළිබඳව මනා අවබෝධයකින් වාසය කළ බවය. එසේ වාසය නොකළේ නම් මෙවැනි සුළු කාරණා මුල් කරගෙන එවැනි තත්ත්වයකට පත්විය නොහැකිය. එසේම උන්වහන්සේලා සතුව පැවති බුද්ධිමය හැකියාව ද මෙයින් පෙන්නුම් කෙරේ. මෙම කරුණු තුළින් භික්ෂූන් වහන්සේලාගේ ආගමානුකූල ජීවිතවල ස්වභාවය මෙන්ම පැරණි ශ්‍රී ලංකාවේ ගැමියන්ගේ ගැමි ජීවිතවල ස්වභාවය කවරේද යන්න පැහැදිලි වෙයි.

රුහුණේ කුරණ්ඩක ලෙන් වැසි චිත්ත ගුත්ත තෙරුන් වහන්සේ අපූරු භික්ෂුවකි. හැට අවුරුද්දක් තිස්සේ එකම අරමුණකින් වාසය කළ උන්වහන්සේ අඩුම තරමින් තමන් වාසය කළ ලෙනේ සිතුවම් දෙස ඇස් අර පියවී සිහියෙන් නොබැලූ



බවත්, තමන්ගේ කුටිය ඉදිරියේ නා ගසක් තිබෙන බව පවා තමන් දැන ගත්තේ බිමට වැටී ඇති මල් රේණු දැකීමෙන් බවත් පැවසේ.[14] මහාගාම පාලකයාට උන්වහන්සේව බැහැ දැකීමට අවශ්‍ය වී වැඩමවාගෙන ඒම සඳහා කණ්ඩායම් තුනක් එව්වේ නමුත් උන්වහන්සේ රජුගේ අභිමුඛයට වැඩියේ නැත. එය නිමිති කරගෙන රජු අසල ගම්වල කුඩා දරුවන්ට මව්කිරි බීමට නොදී මව්වරුන්ටත් දරුවන්ටත් වේදනා දෙන කල ඔවුන් කෙරෙහි කරුණා උපදවා රජු වෙත වැඩම කළහ. එසේ වැඩම වූ උන්වහන්සේ රජ බිසව හා රජු යන දෙදෙනා වන්දනා කරන විට සුවපත් වේවා රජතුමනි යැයි ප්‍රකාශ කළහ. රජුට පමණක් සුවපත් වේවා යැයි කියනුයේ ඇයි දැයි භික්ෂූහු විමසූ විට තෙරුන් වහන්සේ ප්‍රකාශ කළේ මම එහිදී රජෙකු හෝ බිසවක ලෙසින් වෙන් වෙන්ව හඳුනා ගන්නට වෙහෙස නොවූ බවය.[15] උන්වහන්සේගේ ගති ලක්ෂණ මෙන්ම මනා ඉන්ද්‍රිය සංවරයෙන් යුත් භික්ෂුවකගේ ස්වභාවය එයින් මැනවින් ප්‍රකට කෙරේ. මුලදී උන්වහන්සේ රජු බැහැදැකීමට නොගියේ අහංකාරකමින් හෝ අමනාපයකින් හෝ නොවේ. උන්වහන්සේගේ අපේක්ෂාව නිවන් අවබෝධය වන හෙයින් එයට සිත යොමු කිරීම වෙනුවෙනි.

මෙවැනි ම ආකාරයෙන් අසීරු ව්‍රත සමාදානයන් තුළින් නිවන් ලැබූ රහතන් වහන්සේලා කිහිප නමක් පිළිබඳව අටුවාවල සඳහන්ව තිබේ. බෞද්ධ දර්ශනය ශරීරයට දැඩි සේ දුක් දෙන පිළිවෙත් කෙරෙහි දක්වනුයේ දැඩි අප්‍රසාදයකි. නමුත් බුද්ධකාලීන සමාජයේ සිට ම 'ධුතංග, වත්ත, යෝග' ආදි වශයෙන් ගැනෙන විවිධාකාර වූ දුෂ්කර ධුතංග අට වර්ගයක් තිබුණු බව සඳහන් වෙයි.[16] මෙයට අමතරව පැරණි භික්ෂු සමාජයේ භික්ෂූන් වහන්සේලා විසින් සමාදන් වූ ධුතංග දහතුනක් පිළිබඳව විස්තරයක් විසුද්ධිමග්ගයේ තිබේ.[17]

'ගතපච්චාගතවත'[18] නම් ව්‍රතයට සමවැදී මිනිස් වාසයෙන් තොරව ආරඤ්ඤවාසීව විසූ භික්ෂූන් වහන්සේලා ගණනාවක් පිළිබඳව අටුවා ග්‍රන්ථවල සඳහන් වෙයි. මෙම ව්‍රතය පිළිබඳව දිගු

විස්තරයක් සුත්තනිපාතට්ඨකථාවේ තිබේ.[19] එම වත පිරීමෙ දී උන්වහන්සේලා බාහිර සමාජයත් සමඟ ගණුදෙනු කරනු ලබන්නේ ඉතා සීමිත ආකාරයෙනි. නිවන් අරමුණු කරගෙන එක් සමවතකට සමවදින උන්වහන්සේලා භාවනායෝගීව හෝ සක්මන් කරමින් සිය වත පුරති. මෙම වත පුරන ඇතැම් භික්ෂූන් වහන්සේලා මුඛයේ ජලය පුරවාගෙන සිටි බව අටුවාවේ සඳහන් වෙයි.[20] ආළින්දකවැසි 'මහාඵුස්සදේව' හිමියන් ද වසර දහනවයක් තිස්සේ 'ගතපච්චාගතවත' පිරූ භික්ෂුවකි. උන්වහන්සේ පිළිබඳව සිත් ගන්නා විස්තරයක් අටුවාවේ තිබේ. මහාඵුස්සදේව හිමියන් මහ මග නැවති, නැවතී භාවනා කරමින් සිටියේ ය. එසේ භාවනා කර ආපසු හැරී යන තෙරුන් දකින මිනිසුන් 'මේ තෙරනම සිහි නැතිව යමක් මහ ඹග වැටුණ නිසා යන්නේ ද? මග වැරදී යන්නේ ද? යනුවෙන් සිතන්නේ, ඒ බව දැන ගැනීමට තෙරුන්ගෙන් විමසා සිටියේ නමුත් තෙරුන් වහන්සේ ඒ කිසිවක් ගණන් නොගෙන සිය ප්‍රතිපත්තිය පිරූහ. මේ ආකාරයෙන් කමටහන් වැඩූ එම තෙරුන් වහන්සේ විසිවෙනි වර්ෂයේදී රහත් ඵලයට පැමිණියහ.[21] කාළවල්ලිමණ්ඩපවාසී 'මහානාග' හිමියෝ වසර දහසයක් 'ගතපච්චාගත' වත පුරා රහත් බව ලැබූහ. පිඬු පිණිස ගමට පිවිසෙන විට 'කච්ඡක' විලෙන් ජලය ගෙන මුඛය පුරවාගෙන වඩින උන්වහන්සේ මිනිසුන් වඳින විට "දීර්ඝායුෂ වේවා" යි කියන පමණිනුත් තමාගේ භාවනාව කඩ නොකළහ.[22]

මේ ආකාරයෙන් 'ගතපච්චාගත' වත සමාදන්ව වාසය කළ භික්ෂූන් වහන්සේලා පණස් දෙනෙකු පිළිබඳ විස්තරයක් අටුවාවේ සඳහන් වෙයි. උන්වහන්සේලා 'කලම්බතිත්ථ විහාරයේ (කොළොම්තොට) වස් එළඹී අතර රහත්භාවය ලබන තෙක් ඔවුනොවුන් හා කථා නොකරන්නෙමු යැයි කථිකා කරගෙන වාසය කළහ. කාළවල්ලිමණ්ඩපවාසී 'මහානාග' හිමියන් මෙන් ගමට පිඬු පිණිස එළඹෙන විට මුඛයේ ජලය දමාගෙන මිනිසුන් සමඟ කථා නොකර ම ආපසු වැඩියහ. මුඛයේ ජලය පුරවාගෙන



වැඩිය ඔවුන්ගෙන් මිනිසුන් පොහොය ගැන විමසුවේ නම් පමණක් ජලය බැහැර කොට එයට පිළිතුරු දුන්හ. එසේ නොවන විට ජලය ඉවත් කරගෙන පැමිණෙති. පිණ්ඩපාතය ලබා දෙන දායකයෝ මේ තෙරවරු මෙසේ කරනුයේ කුමක් හෙයින් ද යන්න විමසා බලන්නේ ඔවුන් කිසියම් ව්‍රතයකට සමවැදී සිටින්නේ යැයි අවබෝධ කරගෙන ආපසු හැරී ගියහ. වස් අවසානයේ සියලු දෙනා වහන්සේ රහත් ඵලය ලැබූහ.[23]

මහගම තිස්සමහාරාමයේ විසූ 'ගාමන්තපබ්භාරවාසී මහාසිව' මහතෙරුන් අටලොසක් වූ භික්ෂු ගණයාට ත්‍රිපිටකය අර්ථ වශයෙන්ද පාළි වශයෙන්ද ඉගැන්වූ සුප්‍රකට ආචාර්යවරයෙකි. ධුතාංගධාරී භික්ෂූන් වහන්සේ නමක් වූ උන්වහන්සේගේ අවවාද ලැබ රහත් වූ ශිෂ්‍ය හිමිවරු ගණන තිස්දහසක් වූයේ නමුත් උන්වහන්සේ එවැනි අධිගමයකට පැමිණ සිටියේ නැත. සිය ශිෂ්‍ය හිමිගේ ප්‍රශ්න විචාරීමෙන් තමන් වහන්සේ රහත් නොවන බව දැනගෙන දවසේ පශ්චිම කාලයේ සිවුරු පාත්‍රා ගෙන 'ගාමන්තපබ්භාරය' බලා වැඩම කළහ. එහි වැඩිය තෙරුන් වහන්සේ රහත් බවට පැමිණීම මහලොකු දෙයක් නොවේ යැයි සිතා, රහත් බවට පැමිණ මිස, නො නිදන්නෙමි යැයි අදිටන් කොට සක්මන් කරමින් භාවනා කළහ. නමුත් වස් තුන්මාසය ගෙවෙන තෙක් උන්වහන්සේට රහත් වීමට නොහැකි විය. මේ ආකාරයෙන් වසර විසි නවයක් ගත වූ අතර ඒතාක් කල් නිදීම හෝ පා දෙවීම සිදු කළේ නැත. අනෙක් භික්ෂූන් වහන්සේලා විසුද්ධි පවාරණය සිදු කරන්නේ යැයි අසන විට ශෝකයට පත් උන්වහන්සේ තිස් වැනි වස් කාලයේ අවසානයේදී සඳ ඇති රැයක මේ සඳ මඬල පිරිසිදු ද මගේ සීලය පිරිසිදු ද යන්න විමසන තෙරුන් සඳෙහි කැළලක් ඇතැත් සිය සීලයේ එසේ කැළලක් නැතැයි අතිශයින් සතුටට පත්විය. එසේ ප්‍රීතිය උපදවාගෙන එය යටපත් කරමින් විදසුන් වඩා රහත් වූහ.[24] මෙම කථා පුවතට අනුව උන්වහන්සේ දැඩි ව්‍රත සමාදානයකට එළඹුණු භික්ෂුවකි. වසර විසි නවයක් පුරාවට නිදා ගැනීමක් හෝ

පය සේදීමක් නොකළ උන්වහන්සේ මහා වීර්යවන්තයෙකි. සිය පැවිදි ජීවිතය සඵල කර ගැනීම සඳහා භික්ෂුව කොතරම් වීර්යය කරන්නේ ද යන්න මෙවැනි සිදුවීම් තුළින් පැහැදිලි වෙයි. මෙවැනි දුෂ්කර ක්‍රියා තුළින් ඇතැම් විටෙක බුදුන් වහන්සේ ඉගැන් වූ මධ්‍යම ප්‍රතිපදාව ඉක්මවා යන්නේදෝයි හැඟී යයි. මෙයින් භික්ෂු සමාජයේ දක්නට ලැබෙන විචිත්‍ර බව මැනවින් පසක් වෙයි.

මෙවැනි ව්‍රත සමාදානයන් මඟින් රහත් බව ලැබූ මෙරට භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් වෙනත් කිසිදු මූලාශ්‍රයකින් කරුණු අනාවරණය වන්නේ නැත. මෙම සියලු විස්තරයන්ගෙන් පෙන්නුම් කරනුයේ මෙම ව්‍රතය සමාදන් වූ භික්ෂූන් නිවන ඒකායන අරමුණ කරගෙන සිය කාර්යය නිවැරදිව කිරීමට උත්සාහ කළ බව ය. සිය අරමුණ ඉදිරියේ තබාගත් එම භික්ෂූන් මහජනයා සමඟ වදනක් හෝ බිඳීමෙන් වැළකුණාහ. එසේ සිදු කරන්නට හේතුව සිය ව්‍රතය බිඳේවි යන බියයි. මෙයින් පැහැදිලි වනුයේ මෙම භික්ෂු පිරිස සාමාන්‍ය ජනයාගෙන් ව්‍යුක්තව වාසය කිරීමට ප්‍රියතාවයක් දැක් වූ බව ය.

ඇතැම් ව්‍රත සමාදන් වූ භික්ෂූන් වහන්සේලා සිය අරමණු සඵල කර ගැනීම සඳහා මිනිස් වාසය ප්‍රිය නොකළ ද රහතන් වහන්සේ ආත්මාර්ථකාමී අයෙක් නම් නොවේ. උන්වහන්සේලා තමන් ලැබූ අධිගමය අනෙක් පිරිසට ලබාදීම සඳහා දායකත්වය සැපයූ බවට නිදසුන් රැසක් අටුවා මූලාශ්‍රයවලින් අනාවරණය වෙයි. එයට කදිම නිදසුන වනුයේ චූල්ලපිණ්ඩපාතික රහතන් වහන්සේය. උන්වහන්සේ තමන් සමීපයට පැමිනෙන බොහෝ භික්ෂූන් වහන්සේලාට මාර්ගඵල ලාභීත්වට අවශ්‍ය කරන කමටහන් ලබාදීම මහත් වූ ඕනෑකමින් සිදු කර තිබේ.[25] වරක් උන්වහන්සේ වෙත කමටහන් ලබා ගැනීමට භික්ෂූන් වහන්සේලා තුන් නමක් පැමිණි විට මා වෙනුවෙන් ඔබලාට කළ හැකියේ කුමක්දැයි ඇසීය. එක් භික්ෂුවක් ''ඔබ වහන්සේ වෙනුවෙන් පුරුෂ ප්‍රමාණ සියයක් පමණ උස්වූ ප්‍රපාතයකට වැටෙන්නට නිර්භය



වෙමියි කීය. තවත් භික්ෂුවක් ඔබ වහන්සේ වෙනුවෙන් මාගේ ශරීරය විලුඹේ පටන් ගලක උළා අවසන් වෙන තෙක් ගෙවන්ට සමත් යැයි කීය. අනෙක් භික්ෂුව ඔබ වහන්සේ වෙනුවෙන් හුස්ම හිර කරගෙන මැරෙන්න වුවත් සූදානම් බව කීය.''[26] මෙයින් පැහැදිලි වනුයේ පැරණි භික්ෂු සමාජයේ වාසය කළ භික්ෂූන් වහන්සේලාගේ අපේක්ෂාවන් හා උන්වහන්සේලා සතුව පැවති ධෛර්යයේ ස්වභාවයයි. උන්වහන්සේලා පැවිදි ජීවිතය සම්බන්ධයෙන් මෙන්ම සිය ආගමානුකූල ජීවිතය කවරාකාර විය යුතුද යන්න මනා අවබෝධයකින් පසු වූ බව මෙයින් පැහැදිලි වෙයි.

මල්ලාරාමයේ විසූ රහතන් වහන්සේ මෙරට භික්ෂු සමාජයේ සුවිශේෂි චරිතයක් වනුයේ උන්වහන්සේ 'පංසුකූලික' භික්ෂුවක් ලෙසින් වාසය කළ නිසාවෙනි. එවැනි ක්‍රියා පිළිවෙතකට යොමුව සිටි රහතන් වහන්සේලා පිළිබඳව අටුවාවල සඳහන්ව ඇත්තේ සීමා සහිතවය. උන්වහන්සේ දිනක් තමන්ට උපස්ථාන කරන ගෙදරකට ගොස් ඇතුළු ගෙට පිවිස පුටුවක වාඩි වී සිටියේ ය. එම අවස්ථාවේ අසල ඇඳක ගෙදර ගෘහණිය ද නිදාගෙන සිටියා ය. එවිට එහි පැමිණි පිණ්ඩපාතික තෙර නමක් තෙරුන් වහන්සේ ඒ කාන්තාවත් සමඟ එකම ආසනයක ඉන්නේ යැයි හැඟින ගෙන විහාරයට ගොස් පංසුකූලක වූ ඔබ මෙසේ කළේ යැයි දොස් නැඟුවේය.[27] උන්වහන්සේ චෝදනා කළ භික්ෂුවගේ සැකය බැහැර කර සත්‍ය දේ කවරේ ද යන්න පෙන්වා දුන්හ. මෙම කථා පුවත මඳ වෙනස්කමක් සහිතව මැඳුම්සඟි අටුවාවේ සඳහන් වෙයි. එහි දී උන්වහන්සේ 'මුලුප්පල වාපි' විහාරයේ විසූ බව කියවේ. උපස්ථායක ගෙදර ගිය තෙරුන් වහන්සේ ගේ මැද මැටියෙන් උස් කොට තනන ලද (ථණ්ඩිලපීඨිකා) ආසනයට ආසන්නයෙන් අස්නක් පනවා වාඩි කළහ. ඒ ගෙදර ඇමැති දුවණියක් ද ඊට (මැටියෙන් කළ ආසනයෙන් එහා පැත්තේ) මිටි ආසනයක සිටියා ය. මේ අවස්ථාවේ එහි පැමිණි පිණ්ඩපාතික භික්ෂුව තෙරුන් වහන්සේ

හා ස්ත්‍රිය එකම ආසනයක සිටියේ යැයි සිතාගෙන විහාරයට ගොස් තෙරුන්ට දොස් පැවැරීය.[28] පංසුකූලිකයෙකු වූ ඔබට මෙසේ කිරීමට වටින්නේ නැතැයි පිණ්ඩපාතික භික්ෂුව දොස් පවරන්නේ හරි හැටි කරුණු නොදැනය. පිණ්ඩපාතික භික්ෂුව සිය නෙත් දෙකට දර්ශනය වූ දෙයින් ඇති කරගත් මතය වූයේ ස්ත්‍රියත් භික්ෂුවත් එකම අසුනක වාඩි වී සිටින බවය. දැකීම නිවැරදි විය යුතුය. නිශ්චිත කරුණු කාරණා නොදැන අනුන්ට දොස් පැවරීම නොකළ යුතු බව මෙයින් අවධාරණය කෙරේ. රහතන් වහන්සේ ම ප්‍රකාශ කරන ආකාරයට මෙවැනි චෝදනාවක් ඇති වූයේ ඇතුළු ගෙට පිවිස සිටි නිසාය. එසේ ඇතුළු ගෙට පිවිසීම භික්ෂූන් වහන්සේ විසින් නොකළ යුතු කරුණක් බව මෙම සිදුවීමෙන් කියවෙයි. එසේ කිරීමෙන් භික්ෂූන් වහන්සේලා නිකරුණේ චෝදනාවන්ට ලක්වන බව මෙයින් පෙන්නුම් කෙරේ.

මහණ ජීවිතය මස්තකප්‍රාප්ත කර ගන්නා භික්ෂුව මාරයා හඳුනන අතර මාර බැම්මෙන් ද නිදහස් වෙයි. මාරයා මහණ ජීවිතය මස්තකප්‍රාප්ත කරගන්නට වෑයම් කරන භික්ෂූන් වහන්සේලාට නිරතුරුව බාධා සිදු කරයි. ඒ බව 'කටකන්දරවැසි ඵුස්සදේව' තෙරුන් හා සම්බන්ධ කථාවෙන් පසක් වෙයි. බෝ මළුවේ සක්මන් කරමින් සිටින උන්වහන්සේගේ චිත්ත සමාධිය බිඳ දැමීම සඳහා මාරයා විවිධාකාර උපක්‍රම කළේය. මෙවැනි ස්වරූපයෙන් හැසිරෙන්නේ මාරයා බව හැඳිනගත් උන්වහන්සේ, මාරයාට ආමන්ත්‍රණය කොට තමන්ගේ රහත් බව මෙවැනි උපක්‍රමවලින් නවතාලිය නොහැකි බව කියා බුද්ධාරම්මණ ප්‍රීතිය උපදවා විපස්සනාව වඩා රහත් වූහ.[29] සිය පැවිදි ජීවිතයේ අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීම සඳහා නියමිත මාර්ගයට අවතීර්ණ වී සිටින භික්ෂුව මාරයාගේ උපක්‍රමවලින් පවා නවතාලිය නොහැකි බව මෙවැනි සිද්ධීන්ගෙන් සනාථ වෙයි.

'මිලක්ඛතිස්ස' මහරහතන් වහන්සේ හා බැඳි කථා පුවතක් මනොරථපූරණී අටුවාවේ විස්තර කොට තිබේ. එහි සඳහන් වන



ආකාරයට උන්වහන්සේ පැවිදි බව ලැබීමට පෙර, උගුල් අටවා සතුන් දඩයම් කරමින් ජීවත් වූ වැද්දෙකි. ඔහු විසින් සිදු කළ ප්‍රාණඝාතාදි අකුසල ක්‍රියාවන්ට මෙලොවදී ම විපාක දුන්නේ සැබෑ ජීවමාන ප්‍රේතයෙක් සේ හැසුරුණේය. අවසානයේ චුල්ලපිණ්ඩපාතික තිස්ස තෙරුන්ගේ අවවාද අනුශාසනා පිළිගෙන පැවිදි ජීවිතයට එළඹියේ සියලු පව්කම්වලින් ඈත්ව නිවැරදි මාර්ගය ඔස්සේ ගමන් කළේ උත්සාහවත්ව විදසුන් වඩා රහත් බවට පැමිණියේය.[30] මෙලොව කරන ප්‍රාණඝාතාදි අකුසල කර්මයන් යටපත් කරගෙන විදර්ශනා වඩා රහත්වීමේ හැකියාවක් පවතින බව මෙම කථාව දෙස විමසිලිමත්ව බැලීමෙන් තහවුරු වෙයි. එසේම යහපත් අදහස් සිය සිතට ආ විට වැරැද්දෙන් අත් මිදීමේ හැකියාවක් ඕනෑම පව්කාරයෙකුට පවතින බව මෙයින් පසක් වෙයි. සසර පුරුදු තමන් පසු පස ලුහුබැඳ එන බවට මෙම කථාවස්තුව තවත් නිදසුනකි.

චන්දමුඛතිස්ස (සඳමුහුණු) රජුගේ කාලයේ (බු.ව.586) මහාවිහාරයේ ඇස් පෙනීම අඩු මහරහතන් වහන්සේ නමක් වාසය කළ බව අටුවා විස්තරයකින් ප්‍රකාශ වෙයි. රජතුමාට තෙරුන් වහන්සේ පරීක්ෂා කිරීමට සිත් වූයේ විහාරයේ භික්ෂූන් වහන්සේලා පිඬු පිණිස ගිය විට, නිශ්ශබ්දව තෙරුන් වෙත ගොස් සර්පයකු මෙන් හැඟෙන සේ තෙරුන්ගේ පය ඇල්ලීය. ගල් කණුවක් සේ නිසොල්මනේ සිටි උන්වහන්සේ ''මෙහි කවරෙක්දැයි ඇසූහ. ස්වාමීනි, මම තිස්ස යැයි කීය.'' එවිට ''තිස්සය, තාගේ සුවඳ හමනවා නොවේදැයි'' ඇසීය.[31] මහරහතන් වහන්සේ නමකට යමෙක් හඳුනාගැනීමේ හැකියාවක් ඇති බව මෙයින් ප්‍රකට වෙයි.

පුවඟු දිවයිනට වැඩිය මහානාග රහතන් වහන්සේ ද අපූරු චරිතයකින් හෙබි භික්ෂුවකි. උන්වහන්සේ සිය මවගේ ගමට පිඬු පිණිස වැඩම කළහ. මව උන්වහන්සේට කැඳ පිළියෙල කරදී අසුන් ගලේ වාඩි කරවීය. තෙරුන් වහන්සේ දන් පිළියෙළ කරන තෙක් නිරෝධ සමාපත්තියට සම වැදුණාහ. එම මොහොතේ

ආසන ශාලාව ගින්නෙන් දැවෙන්නට පටන් ගත්තේය. එහි පැමිණි සෙසු භික්ෂූන් වහන්සේලා තම තමන්ගේ ආසන රැගෙන ඉවතට ගියහ. ගම් වැසියෝ එහි රැස් වී ගිනිගත් ශාලාවෙන් පිට නොවී වැඩහුන් තෙරුන් දැක "අලස මහණෙකැ"යි කීහ. ගින්න මහත්සේ නැගී සිටිය අතර මිනිසුන් ජලය ගෙනවිත් ගින්න නිවන්නට කටයුතු කළහ. ගින්නට හසුව තෙරුන් වහන්සේ නොමළ බව දැක එහි රැස් වූ පිරිස් පොළොව පිරිසිදු කොට මල් විසුරුවා වඳිමින් සිටියහ. තෙරුන් වහන්සේ නියමිත කාලයේදී සමාධියෙන් නැගී සිටියේ එහි රැස්ව සිටින මිනිසුන් දැක තමාගේ රහත් බව හෙළි වූ බැවින් නො සතුටුව අහසට නැගී පුවඟු දිවයිනට (පියංගුද්වීපයට) ගියහ.[32] මහානාග තෙරුන්ට තමන්ගේ රහත් බව සඟවා ගෙන සිටීමට අවශ්‍ය වූයේ ඇයි ද යන්න ප්‍රශ්නයකි. රහත් බව සැඟවිය යුත්තක් ද? මිනිසුන්ට තමන්ගේ රහත් බව තුළින් බොහෝ පිං රැස් කරගත හැකි බව උන්වහන්සේ සිතුවේ නැත්තේ ඇයි ද යන්න මෙහිදී උද්ගත වන තවත් ප්‍රශ්නයකි. තමන් වහන්සේ හා අනෙකුත් භික්ෂූන් වහන්සේලා වට කරගෙන ගිනි ජාලාවක් පැන නගිද්දිත් ඵල සමාධියෙන් නැගී නොසිටියේ මන්ද යන්න මෙහිදී ඉස්මතු වන තවත් පෙහෙලිකාවකි. අවසානයේ තමන්ගේ රහත් බව දැන ගත්තේ යැයි සලකා උන්වහන්සේ වෙනත් ප්‍රදේශයකට යන්න සිතුවේ ඇයි ද යන්න සිතා ගත නොහැකිය. හිතා මතාම තමන්ගේ රහත් බව හෙළි නොකළ යුතුය. නමුත් තෙරුන් වහන්සේ ඵල සමවතකට එළඹ සිටිය අවස්ථාවකයි මෙම තත්ත්වය ඇති වූයේ. තෙරුන් වහන්සේ මෙහිදී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත අප ඉදිරියේ ප්‍රශ්න ගණනාවක් ඉස්මතු කරවයි.

පැවිදි ජීවිතය සඵල කර ගැනීම සඳහා භික්ෂුවක් සමීපයේ තිබිය යුතු පළමු ගුණාංගය වනුයේ දැඩි වීර්යයයි. දැඩි වීර්යයෙන් කටයුතු කොට රහත් බව ලැබූ භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු පිළිබඳව අටුවාවල සඳහන්ව තිබේ. සෝණ,[33] නාගපබ්බතවාසී පධානියතිස්ස යන හිමිවරු ද චූළනාගලෙන්



වැසි හා සිතුල්පව්වේ භාවනායෝගීව වැඩ විසූ බොහෝ භික්ෂූහු ද දැඩි චිත්ත සමාධියෙන් යුතුව රහත් බව ලැබූහ.[34] ගාමන්තරපබ්භාරවාසී මහාසීව, පීතිමල්ලක, කුටුම්බියපුත්ත, උච්චවාලිකවාසී මහානාග (උච්චවාලිකවාසී මහානාග හිමියන් කායික වීර්යය හා චෛතසික වීර්යය යන දෙයාකාර වීර්යයෙන් ආරබ්ධ වීර්යය ඇත්තෙකු සේ සැළකේ.) වැනි භික්ෂු චරිත ද දැඩි වීර්යය ඇති රහතන් වහන්සේලා බව අටුවා විස්තරවලින් පැහැදිලි වෙයි.[35]

අනුරාධපුරයේ වූ පූජනීය ස්ථාන වන්දනා කිරීම සඳහා සාමාන්‍ය භික්ෂූන් වහන්සේලා මෙන්ම මහරහතන් වහන්සේලා ද පැමිණි බවට තොරතුරු ලැබේ. එක් මහරහත් තෙර නමක් 'භණ්ඩගාහක' නම් වූ හෙරණ භික්ෂුවක් සමඟ චෛත්‍ය වන්දනා කිරීමට සෑ මළුව වෙත පැමිණියහ. උන්වහන්සේ හවස් යාමයේ භික්ෂූන් වහන්සේලා වන්දනා කරන වේලාවට අමතරව මහජනයාගෙන් සෑ මළුව හිස් වූ විට හුදකලාව ද පැමිණ චෛත්‍යය වන්දනා කළ බව කියැවේ.[36] රහතන් වහන්සේලා හුදකලා ජීවිතය ප්‍රිය කළ බව මෙයින් වැටහෙයි. මේ ආකාරයෙන් අනුරාධපුර යුගයේ මුල් කාලපරිච්ඡේදයේදී මහාබෝධිය, මහාසෑය ආදි පූජනීය ස්ථාන රහතන් වහන්සේලාගෙන් මෙන්ම සාමාන්‍ය භික්ෂූන්ගෙන් පිරී ඉතිරී පවතින්නට ඇතැයි විශ්වාස කළ හැකිය. මෙවැනි විස්තර වංසකථා ආදි වෙනත් මූලාශ්‍රවල දක්නට නොලැබෙන නව තොරතුරු වන හෙයින් මෙයින් අනුරාධපුර පූජා භූමියේ සැබෑ ස්වරූපය පෙන්නුම් කෙරේ.

### ❖ පැරණි ශ්‍රී ලාංකේය සමාජය තුළ රහතන් වහන්සේට හිමි වූ තත්ත්වය

මෙරට භික්ෂු සමාජයේ වාසය කළ බොහෝ රහතන් වහන්සේලා භික්ෂු සමාජයේ මෙන්ම ගිහි සමාජයේ ගෞරවනීයත්වයට හා වන්දනීයත්වයට ලක් වූ බව අටුවාවල එන විස්තරවලින් පැහැදිලි වෙයි. එබඳු චරිත ඇති රහතන්

වහන්සේලා පිළිබඳව මෙහිදී අධ්‍යයනය කෙරේ. දහස් ගණනක් වූ රහතන් වහන්සේලා අතුරින් උච්චවාලිකවාසී මහානාග රහතන් වහන්සේ සමකාලීන භික්ෂු සමාජයේ ගෞරවයට පාත්‍ර වූ ථෙර නමක් ලෙසින් හඳුනාගත හැකිය. උන්වහන්සේ බොහෝ ශිෂ්‍ය ගණයාට ධර්මඥානය හා භාවනාවට අවශ්‍ය කරන කමටහන් ආදිය ලබා දෙමින් වාසය කළ බහුස්සුත භික්ෂුවකි. උන්වහන්සේ වෙතින් කමටහන් ලබාගත් භික්ෂූන් විශාල වශයෙන් රහත් භාවයට පත් වුව ද උන්වහන්සේට එම තත්ත්වයට පත් වීමට නොහැකිව විසීය. නමුත් උන්වහන්සේ වසර හැටක් සිතාගෙන සිටියේ තමන් වහන්සේ රහත්භාවය ලබා ඇති බවය. තලගුරු විහාරයේ විසූ ධම්මදින්න රහතන් වහන්සේ මහානාග හිමියන්ගේ ශිෂ්‍යයෙකු වූ අතර සිය ගුරුවරයා වෙත අනුකම්පා උපදවා එහි වැඩම කොට ධර්මය පිළිබඳව කරුණු විමසා ඍද්ධි බලය පෑමට හැකිදැයි විමසා සිටියහ. හැකි යැයි කී විට, එසේ නම් ඇතෙකු මවන ලෙස කීහ. උන්වහන්සේ විශාල ඇතෙකු මැවූහ. ඌ භයානක විලාශයක් දක්වමින් ඉදිරියට එන ආකාරයට මවන මෙන් කීහ. එය ද කරන කල්හී තැතිගෙන නැගිට දුවන්නට සැරසෙන තෙරුන් වහන්සේගේ සිවුරු කොණකින් අල්වාගත් ධම්මදින්න හිමියන් රහතන් වහන්සේලාට භය නූපදින බව කීය. ඒ අවස්ථාවේදී තමන් රහත් නොවේ යැයි අවබෝධ කරගත් මහානාග හිමියෝ ධම්මදින්න හිමියන්ගේ දෙපාමුල වැටී කමටහන් ඉල්ලූහ. ධම්මදින්න හිමියන් කමටහන් දීමෙන් පසු පියවර තුනක් යාමේදී රහත් ඵලයට පැමිණියහ.[37] මහානාග හිමියන්ගේ නිහතමානී බව මෙම කථාව තුළින් ප්‍රකට කෙරේ. උන්වහන්සේ ධර්මය සම්බන්ධයෙන් තිබූ හසළ දැනුම නිසා තමන් වහන්සේ රහතන් වහන්සේ නමක් යැයි සිතාගෙන සිටියහ. ධර්මය සම්බන්ධයෙන් හසළ දැනුමක් ඇති අයට එවැනි හැඟීමක් ඇතිවිය හැකිය. ධර්මය පිළිබඳ දැනීමත් ධර්මය පිළිබඳ අවබෝධයත් දෙකක් බව මෙයින් පැහැදිලිය. කෙසේ නමුදු මෙරට බොහෝ පැවිදි භික්ෂූන් වහන්සේලාට නිවන් අවබෝධ කර ගැනීමට අවශ්‍ය කරන මාර්ගෝපදේශකත්වය ලබාදුන් භික්ෂුවක් වශයෙන් සංඝ සමාජය තුළ උන්වහන්සේ ගෞරවාදරයට ලක්ව ඇති බව පෙනේ.



රුහුණු ප්‍රදේශයේ විසූ තලගුරු වැසි ධම්මදින්න තෙරුන් වහන්සේ සමකාලීන භික්ෂු සමාජයේ බහුමානනීය රහත් තෙර නමකි. ධම්මදින්න රහතන් වහන්සේ පිළිබඳ සඳහනක් මහාවංසයේ ද,[38] රසවාහිනියේ 'සද්ධාසුමනාගේ' කථා වස්තුවේ ද ඇතුළත්ව ඇත.[39] එම විස්තරයන්ට අනුව පැහැදිලි වනුයේ උන්වහන්සේ දුටුගැමුණු හෝ සද්ධාතිස්ස රජ අවධියේ ජීවත් වූ බවය. උන්වහන්සේ හා සම්බන්ධ කථා පුවතක් පපඤ්චසූදනීයේ[40] ද දක්නට ලැබේ. පපඤ්චසූදනියේ සඳහන් වන ආකාරයට උන්වහන්සේ කැඳවාගෙන ඒමට තිස්සමහාරාමවැසි භික්ෂු කණ්ඩායම් දෙකක් වැඩියහ. එසේ වැඩිය කණ්ඩායම් දෙකම උන්වහන්සේ වෙතින් අවවාද ගෙන රහත් බවට පැමිණ තලගුරු විහාරයේ ම විසූහ. තිස්සමහාවිහාරයේ භික්ෂූහු තෙවන වර මහලු කල පැවිදි වූ භික්ෂුවක් යැවූහ. උන්වහන්සේ එහි ගොස් සංඝයාගේ අණට ගරු නොකරන්නේ මන්දැයි විමසා සිටියහ. එකිණෙහි ම උන්වහන්සේ තිස්සමහාරාමය බලා පිටත් වූහ. අතරමගදී 'හංකන' විහාරයේ විසූ සැටවස් සපිරි තෙර නමකට හා තමන් රහත් යැයි සිතාගෙන සිටි සිතුල්පව්වේ (මෙම භික්ෂුව රෝහණවාසී මහාතිස්ස නමින්ද හඳුන්වයි) භික්ෂුවකට රහත් වීමට අවශ්‍ය මග කියා දුන්හ. එම දෙදෙනා වහන්සේ ම පසුව රහත් වූහ. එහිදී සිතුල්පව්වේ විසූ භික්ෂුව රහත් නොවන බව පෙන්වීමට ගත් ප්‍රයත්නය විචිත්‍ර වූවකි. ධම්මදින්න හිමියන් රහත් යැයි සිතාගෙන සිටි භික්ෂුවට පොකුණක් මවා එහි නෙළුම් මල් ගොමුවක් මවන ලෙස කීය. එම භික්ෂුව එසේ කළේය. නැවත එම මල් ගොමුවේ ලස්සන ගී කියන, නටන ස්ත්‍රී රූපයක් මවන මෙන් කීය. එසේ කරන විට භික්ෂුවට රාගය ඉපදුණි. මෙයින් තමන් රහත් නොවන බව අවබෝධ කර ගත්තේය.[41] මෙවැනි තොරතුරුවලින් පැරණි භික්ෂු සමාජය තුළ ද තමන් වහන්සේ රහත් යැයි මත් මුළා වී සිටිය භික්ෂූන් වහන්සේලා හඳුනාගත

හැකිය. උන්වහන්සේලා වංචනිකයන් ලෙසින් හෝ ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ පරමාර්ථයෙන් හෝ එසේ වාසය කළේ නැත. රහත් නොවන බව පෙන්වා දුන් කෙණෙහි ම උන්වහන්සේලා කරුණු අවබෝධ කරගෙන රහත් වීම සඳහා වෑයම් කිරීමෙන් ඒ බව සනාථ වෙයි. එය ඇගයිය යුතු කරුණක් ලෙසින් සැලකිය යුතුය. උන්වහන්සේලා ධර්මධරයන් වූ අතර ඔවුන් වැරදි අවබෝධයෙන් ගලවා යථාර්ථය පහදා දෙන්නට රහතන් වහන්සේලා කටයුතු කිරීම ද ප්‍රශංසනීය වෙයි.

ධම්මදින්න හිමියන් තිස්සමහාරාමයට වඩින විට එහි සිටි භික්ෂූන් වහන්සේලා සෑ මලු ආදිය අමදීමෙන් බුද්ධාලම්බන ප්‍රීතියෙන් සිටියහ. එසේ සිටි එක ම භික්ෂුවක්වත් ධම්මදින්න හිමියන්ට ආගන්තුක වතාවත් සිදු කළේ නැත. තම විහාරයට වැඩ සිටිනුයේ ධම්මදින්න හිමියන් යැයි සිතාගෙන එහි සිටි භික්ෂු පිරිස ප්‍රශ්න විචාළහ. ඒවාට පිළිතුරු දුන් ධම්මදින්න හිමියෝ පයේ ඇඟිල්ලෙන් මහපොළොවට ගසා 'මේ අචේතනික වූ මහපොළොවත් මගේ ගුණ දනී. ඔබ වහන්සේලා මගේ ගුණ නොදන්නේ යැයි' කියා අහසට නැගී තලගුරු විහාරයට ම වැඩියහ.[42] මෙම කථාව මඳ වෙනස්කම් සහිතව මනොරථපූරණී අටුවාවේ සඳහන් වෙයි.[43] මෙම කථා වස්තුවේ දක්නට ලැබෙන ''පාදංගුලියා මහාපඨවිං පහරි.''[44] යන වචනය තුළින් ගම්‍ය කරන අදහස වනුයේ පා ඇඟිලිවලින් මහ පොළොවට පහර දුන් බවය. රහතන් වහන්සේ නමක් විසින් මෙවැනි කටයුත්තක් සිදු කරයිද යන්න සිතාගත නොහැකිය. නමුත් මෙවැනි වාර්තාවක් අටුවාව තුළ ඇතුළත්ව තිබේ.

මලියදේව මහරහතන් වහන්සේ සමස්ත ශ්‍රී ලංකාවාසීන්ගේ ගෞරවයට පාත්‍ර වූ තෙර නමකි. උන්වහන්සේ දුටුගැමුණු රජ අවධියේ හෝ ඊට මදක් පෙර අවධියේ හෝ වාසය කළ රහතන් වහන්සේ නමක් බව මූලාශ්‍රයවලින් තහවුරු වෙයි.[45] උන්වහන්සේ පිළිබඳව අටුවා මූලාශ්‍රය කිහිපයක ම තොරතුරු සඳහන් වන අතර උන්වහන්සේ විසින් කරන ලද ධර්ම



දේශනයක් පිළිබඳව අංගුත්තරනිකායට්ඨකථාවේ[46] සඳහන් වෙයි. එහිදී උන්වහන්සේගේ නාමය 'මලියදෙවථෙර' යනුවෙන් සඳහන් කර තිබේ.[47] මලය රටේ උපන් දේව තෙරුන් එනමින් හැඳින්වූවා විය හැකිය. බොහෝ ස්ථානවල උන්වහන්සේගේ නම සඳහන් කර ඇත්තේ එලෙසිනි. මැදුම්සඟි අටුවාවේදී උන්වහන්සේගේ නම 'මාලෙය්‍යදෙවථෙර'[48] යනුවෙන් හඳුන්වා ඇති බව පොල්වත්තේ බුද්ධදත්ත හිමි පෙන්වා දෙන අතර මෙම පාඨයෙන් 'මාල දිවයිනේ' උපන් අයෙකුට ද මෙනමින් ඇමතිය හැකි බවට අදහස් කරති. මාල දිවයිනේ පෙර බොහෝ සිංහලයන් විසූ හෙයින් එය අරුමයක් නොවන බව උන්වහන්සේගේ අදහසයි.[49] නමුත් මැදුම්සඟි අටුවාවේ 'ඡඡක්ක' සූත්‍ර වර්ණනාවේදී උන්වහන්සේගේ නම සඳහන් කරන හැම තැනකදී ම සඳහන් කර ඇත්තේ 'මලියදෙව' යනුවෙනි.[50] බුද්ධදත්ත හිමි 'මාලෙය්‍යදෙවථෙර' යන පදය කුමන අටුවා ග්‍රන්ථයකින් ගත්තේ ද යන්න සඳහන් නොවන නිසා උන්වහන්සේ ඉදිරිපත් කරන තර්කය නිශ්චිත වශයෙන් පිළිගත නොහැකි ය. ශ්‍රී ලංකාවේ 'මලය' දේශයේ විසූ හෙයින් උන්වහන්සේ මෙනමින් හඳුන්වන්නට ඇතැයි සිතීම යුක්ති සහගතය.

පැවිදි ජීවිතයට එළඹි මුල් අවධියේ මලියදේව තෙරුන් වහන්සේ දක්ෂයෙකු නොවූ නමුත් වසර ගණනකින් ධර්මය පිළිබඳ විශාල අවබෝධයක් ලැබූහ. උන්වහන්සේ අධ්‍යාපනය ලබන කාල සීමාව තුළ පිණ්ඩපාතය සපයමින්, පුත්‍ර ස්නේහයෙන් කටයුතු කළ උපාසිකාවක් විය. ඇය මලියදේව හිමියන් රහත් වීමෙන් පසුව ත්‍රිපිටකය අළලා කරන ලද ප්‍රථම ධර්ම දේශනාවේදී ම සෝවාන් තත්ත්වයට පත් වූ බව මනොරථපූරණියේ සඳහන් වෙයි.[51] මැදුම්සඟි අටුවාවේ 'ඡඡක්ක' සූත්‍ර වර්ණනාවේ සඳහන් වෙන ආකාරයට උන්වහන්සේ ශ්‍රී ලංකාව පුරාම පාගේ වැඩම කරමින් 'ඡඡක්ක' සූත්‍රයෙන් ධර්ම දේශනා සිදු කොට තිබේ. එම ධර්ම දේශනාවන් ශ්‍රවණය කළ

බොහෝ භික්ෂූන් වහන්සේලා රහත් වූ බවත් වැඩම කළ හැම ස්ථානයකදී ම උන්වහන්සේට විශාල පිළිගැනීමක් තිබුණු බවත් එහි එන විස්තරවලින් පැහැදිලි වෙයි.[52] 'ඡජක්ක' සූත්‍ර වර්ණනාවට අනුව 'ලෝහප්‍රාසාදයේ'දී ද ධර්ම දේශනා කළ බව සඳහන් වීමෙන් පැහැදිලි වනුයේ උන්වහන්සේ දුටුගැමුණු අවධියේ හෝ ඊට පසුකාලීනව වාසය කළ බවය. දිවයිනේ විවිධ ප්‍රදේශවල සංචාරය කරමින් ධර්ම දේශනා පවත්වා බොහෝ පිරිසකට නිවන් සලසා දුන් හෙයින් ශ්‍රී ලාංකේය ජනතාව අතර උන්වහන්සේ ප්‍රසිද්ධ වූවේ යැයි සිතිය හැකිය. ජාතකට්ඨකථාවේ 'මූගපක්ඛ' ජාතක වර්ණනාවේදී කාළවේලවාසී මලියදේව හිමියන් පිරිනිවන් පාන විට 'මූකපක්ඛ' ජාතකේ ආ පිරිස අවසන් විය යැයි කියා තිබේ.[53] ඇතැම් විටක උන්වහන්සේ මෙරට අවසන් රහතන් වහන්සේ යැයි හැඳින්වීම සඳහා මෙය ද කිසියම් ආකාරයක බලපෑමක් කළා විය හැකිය. නමුත් අටුවා විස්තරවලට අනුව එය සත්‍ය නොවන බව වසභ රජ අවධියේද රහතන් වහන්සේ නමක් වැඩ සිටීමෙන් පැහැදිලි වෙයි.

මංගණවාසී බුජ්ජතිස්ස රහතන් වහන්සේ සද්ධාතිස්ස රාජ්‍ය අවධියේ විසූ සුප්‍රසිද්ධ ථෙර නමකි.[54] උන්වහන්සේ පිළිබඳව අටුවාවේ සුවිශේෂිත කථාවක් තිබේ. එහි සඳහන් වන ආකාරයට සද්ධාතිස්ස මහරජුට උපදෙස් දීමට හා වන්දනයට සුදුසු තෙර නමක් සොයා දෙන්න යැයි සංඝයාගෙන් ඉල්ලුවේ ය. ඒ හැම දෙනාගේම නියමය වූයේ අනුරාධපුරයට පස් යොදුන් දුරකින් වැඩ සිටි බුජ්ජතිස්ස තෙරුන්ය. උන්වහන්සේ බැහැ දැකීමට රජතුමා පිරිවර සහිතව යන විට එම මහා ශබ්දය අසා මේ කිමෙක්දැයි භික්ෂූන්ගෙන් විමසා සිටියහ. ඔබ වහන්සේ දැකීමට රජු පැමිණියේ යැයි කී විට ''මහලු කල මට රජ ගෙදරින් ඇති වැඩය කිමෙක්දැයි'' සිතා දිවාස්ථානයේ වූ ඇඳෙහි වැතිර බිම ඉරි අඳිමින් හුන්හ. රජු සමීපයට ගොස් උන්වහන්සේගේ ක්‍රියාව දැක රහතුන්ගේ හස්ත විකාරයක් නැත. මෙතුමා රහත් කෙනෙකු නොවන්නේ යැයි සිතා නොවැඳම හැරී ගියේය. කුමක් හෙයින්



ශ්‍රද්ධාවත් රජු කලකිරවන ලද්දේ දැයි විමසූ අනෙක් භික්ෂූහු රජු පැහැදවීම ඔබ වහන්සේට ම භාර යැයි කීහ. ඒ අනුව උන්වහන්සේ, පිරිනිවීමෙන් පසුව කූළුගෙය අහසින් ගොස් රජමාලිගයේ පිහිටනු ලැබේවා යැයි අධිෂ්ඨාන කළහ. බුජ්ජතිස්ස තෙරුන්ගේ කුළුගෙය අහසින් එන්නේ යැයි රජුට කී නමුත් රජු එය විශ්වාස කළේ නැත. කුළුගෙය ලෝවාමහාප්‍රාසාදය සමීපයට එන විට බුජ්ජතිස්ස තෙරුන්ගේ මිතුරු 'මහාව්‍යග්ඝ' හිමියෝ ලෝවාමහාප්‍රාසාදයේ හත්වැනි මහලේ විනය කර්ම කරමින් සිටියහ. පිරිසගෙන් සමාව ගත් උන්වහන්සේ දෙවන කුළුගෙයට ඇතුළ්ව පිරිනිවියහ. රජු අතිශයින් පැහැදීමට පත්ව දෙදෙනා වහන්සේගේ ම ආදාහන කටයුතු සිදුකර චෛත්‍යයක් බැන්ද වූ බව අටුවාවේ විස්තර කෙරේ.[55] බුජ්ජතිස්ස රහතන් වහන්සේගේ කථාව හා බැඳි සුවිශේෂිත කරුණ වනුයේ උන්වහන්සේ රජු පැමිණෙන විට මට රජුගෙන් ඵලක් නොවන්නේ යැයි කියා හස්ත විකාර කරමින් සිටි කරුණය. රහතන් වහන්සේ නමක් වූ උන්වහන්සේ ඒ ආකාරයෙන් හස්ත විකාර කරමින් සිටියේ කුමන සිතුවිල්ලක් උදෙසා ද යන්න ප්‍රශ්නකාරිය. නුවණැති තෙරුන් වහන්සේ තමන්ගේ ක්‍රියාවෙන් රජු අශ්‍රද්ධාවන්ත වන බව හොඳාකාරව ම දන්නේය. එසේ දැන දැනත් මේ ආකාරයෙන් හැසිරීම විසඳාගත නොහැකි ප්‍රශ්නයකි.

බුජ්ජතිස්ස තෙරුන් පිළිබඳව ජාතක අටුවාවේ 'මිගපක්ඛ' ජාතකයේ සඳහන් වන අතර උන්වහන්සේගේ නම එහිදී ප්‍රථමයෙන් ම නම් කර තිබේ. 'මංගණවාසී බුද්දකතිස්ස' යනුවෙන් උන්වහන්සේගේ නමේ සුළු වෙනසක් එහි දක්නට ලැබේ.[56] මහාවංසයේ උන්වහන්සේ හඳුන්වා ඇත්තේ 'මංගණවාසී බුද්දතිස්ස' යනුවෙනි.[57] උන්වහන්සේගේ නම දැක්වීමේදී අක්ෂරවල සුළු සුළු වෙනස්කම් ඇතිමුත් මෙම නම් කිහිපයෙන් ම හඳුන්වන්නේ එකම තෙරුන් වහන්සේ බව පැහැදිලිය. ක්‍රි. ව. 15 වන සියවසේ රචිත යැයි පිළි ගැනෙන ලෝකප්පදීපකසාර නම් කෘතියේ මෙම තෙරුන් පිළිබඳව

විස්තරයක් ඇති බවත් එය අටුවා විස්තරයට වඩා මඳ වෙනස්කම්වලින් යුක්ත බවත් බුද්ධදත්ත හිමියන්ගේ අදහසයි.[58]

කාළවල්ලිමණ්ඩපවාසී මහානාග මහතෙරුන් කාවන්තිස්ස මහරජ අවධියේ මාගම ප්‍රදේශයේ විසූ රහතන් වහන්සේ නමකි.[59] මහානාග තෙරුන්ගේ ගුණ සමුදාය මෙරට පමණක් නොව දඹදිව ද පතළව තිබූ බව **අංගුත්තරනිකායට්ඨකථාවේ** එන කථාවකින් පැහැදිලි වෙයි.[60] මෙම තෙරුන් වහන්සේගේ ගුණ පිළිබඳව අසා දැනගත් බමුණන් දෙදෙනෙක් දඹදිව සිට මෙහි එන්නට පිටත් වූ අතර එක් අයෙකු අතරමගදී මළේය. අනෙක් බමුණා මාතොටින් ගොඩබැස රුහුණේ වූ 'කාළවල්ලිමණ්ඩපය' සොයා ගියේය. තෙරුන් වහන්සේ සමීපයට ගොස් වැඳ ඔබ වහන්සේ මහ 'උස්' යැයි කීය.[61] මෙහිදී භාවිත කළ 'උස්' යන වචනයෙන් උසස් බව හැඟවෙයි. මහානාග තෙරුන් පිළිබඳව ප්‍රසාදයට පත් බමුණා තෙරුන් වෙත පැවිදිව රහත් බව ලැබීය. මෙරට විසූ රහතන් වහන්සේලා ශ්‍රී ලංකාද්වීපයේ පමණක් නොව දඹදිව ද ප්‍රසිද්ධව සිටි බව මෙවැනි කථා තුළින් ප්‍රකට වෙයි. මෙම තෙරුන් වහන්සේ පිළිබඳ විස්තරයක් **අත්ථසාලිනී** අටුවාවේ ද සඳහන්ව තිබේ. එම විස්තරය 'භුත්තසාල' (බුත්තල) නම් ගම හා බැඳී පවතී. මෙම ගම සොරුන් පැහැර ගත් කල්හී 'නකුලනගරය' වෙත පැමිණි භික්ෂුණියකට තෙරුන් වහන්සේ සිය පාත්‍රයෙන් දානය පිළිගැන් වූ බවත් එතැන් පටන් භික්ෂුණියගේ අධිෂ්ඨාන බලයෙන් තෙරුන් වහන්සේට 'අඩකහවණුවකට' වඩා වටිනාකම් ඇති පිණ්ඩපාතයක් නිරායාසයෙන් ලැබුණු බවත් සඳහන් වෙයි.[62] මෙම තෙරුන් වහන්සේ 'ගතපච්චාගතවත' නම් වත වසර දාසයක් පුරා රහත් බවට පැමිණි බවත් එම කාල සීමාව තුළ 'වත' කැඩේවි යැයි සිතා 'කච්ඡක' විලෙන් ජලය ගෙන මුඛය පුරවාගෙන සිටිය බවත් **සුමංගලවිලාසිනියේ** විස්තර කර තිබේ.[63] 'ගතපච්චාගතවත' නම් ව්‍රතසමාදානය පැවිදි භික්ෂූන්ට අමාරු කර්තව්‍යයක් වන නමුත් මෙම තෙරුන් වහන්සේ දැඩි



වීර්යවන්තව එම ව්‍රතය ක්‍රියාවට නැංවූ බව එහි එන විස්තරයෙන් පැහැදිලි වෙයි.

සද්ධාතිස්ස මහරජ තුමාගේ අවධියේ ජීවත් වූ 'කාල බුද්ධරක්ඛිත' මහතෙරුන් භික්ෂූන්ට ධර්මය උගන්වමින් වැඩ සිටි ගණාචාර්ය වූ භික්ෂුවකි. දක්ෂිණගිරි විහාරයේ දායක ගමක ඇමති කුලයක උපන් උන්වහන්සේ එක් දිනක සිය උපාධ්‍යායන් වහන්සේ වෙත ශිෂ්‍යයින් පිරිවරාගෙන ගිය නමුත් උපාධ්‍යාය හිමියන් කිසිවක් කථා නොකර සිටියේය. මා උගතෙක්ව ආ පසුත් මා හා කිසිවක් කථා නොකර සිටින්නට හේතුව කවරේදැයි විමසා සිටියේ ය. එවිට බුද්ධරක්ඛිතය, පැවිදිකිස මෙතෙකින් මස්තකප්‍රාප්ත වන්නේ නැත. පිරිස හා බැඳුම් හැරදමා 'වාතකසිණපබ්බත' විහාරයට ගොස් මහණ දම් පුරවයි අවවාද කළහ.[64] උපාධ්‍යායයන් වහන්සේගේ අවවාද පිළිගත් බුද්ධරක්ඛිත තෙරණුවෝ රහත් වූහ.

ධර්ම දේශනා කිරීමේ හසළ දැනුමකින් පිරිපුන් බුද්ධරක්ඛිත හිමි රහත් බවට පැමිණීමෙන් පසුව වාසය කළේ සෑ ගිරියේ ය. එක් පොහෝ දිනක තෙරුන් වහන්සේ කණ්ටකසෑය වැඳ 'කලු තිඹිරිගස' මුල වැඩ සිටියේ ය. එවිට එක් පිණ්ඩපාතික භික්ෂුවක් 'කාලකාරාම' සූත්‍රයෙන් ප්‍රශ්නයක් විචාළේය. තෙරුන් වහන්සේ එහි සිටම බණ දේශනා කිරීමට පටන් ගත්හ. එදින සිල් සමාදන් වූ සද්ධාතිස්ස රජු සෑගිරියේ 'රාජගිරි' ලෙනේ සිට එහි පැමිණ, හිමිදිරි උදෑසන තෙක් සිටිගෙනම බණ ඇසීය. බුද්ධරක්ඛිත හිමියන්ගේ ධර්ම දේශනාවට පැහැදුණු රජු ලංකා රාජ්‍යය තෙරුන්ට පිදීය. ලංකා රාජ්‍ය නැවතත් රජුට භාර දුන් තෙරණුවෝ ධර්මයෙන් රාජ්‍යය පාලනය කරන මෙන් උපදෙස් දුන්හ.[65] නියම මහණකම යනු ගණාචාර්යව විසීමවත් ශිෂ්‍ය පිරිසක් ඇතිකර ගැනීමවත් නොව, මහණකම මස්තකප්‍රාප්ත වන ආකාරයෙන් නිවන් අවබෝධ කර ගැනීම බව මෙයින් නිරූපණය වෙයි. ඉගෙන ගැනීමෙන් දැනුම ලබාගත හැකි බවත් එයින් නිවන් අවබෝධ වන්නේ නැති බවත් මෙයින් අවධාරිත වෙයි.

## නිගමනය

මෙම විස්තරවලට අනුව පැරණි ශ්‍රී ලාංකේය භික්ෂු සංඝ සමාජය මහරහතන් වහන්සේලාගෙන් පිරිපුන් සංස්ථාවක් බව පැහැදිලි වෙයි. එම රහතන් වහන්සේලාගේ චරිත හා හැකියාවන් සම්බන්ධයෙන් වුව දක්නට ලැබෙන විවිධත්වය සිත් ගන්නා සුළුය. මෙවැනි රහතන් වහන්සේලාගෙන් සමලංකෘත පැවිදි සමාජය නිරතුරුව පැවිදි ජීවිතයකට අවශ්‍ය කරන ගුණාංගයන්ගෙන් හා ප්‍රතිපදාවන්ගෙන් සමන්විත වන්නට ඇතැයි සිතිය හැකිය. ඉහත සඳහන් කළ බොහෝ රහතන් වහන්සේලා පිළිබඳව වංසකථා ආදී සාහිත්‍යය මූලාශ්‍රයවල සඳහන් වන්නේ නැත. බොහෝ කරුණු අටුවා තුළින් පමණක් අනාවරණය වන ඒවාය. රහත් බව ලැබීමට ශරීරයට දැඩිසේ දුක් දීම බුදුන් වහන්සේ අනුමත නොකළ ද මෙරට බොහෝ භික්ෂූන් වහන්සේලා පැවිදි ජීවිතය මස්තකප්‍රාප්ත කර ගැනීම සඳහා දැඩි පිළිවෙත්වලට එළඹී බව ඉහත විස්තරවලින් ගම්‍ය වෙයි. එම චරිත මෙරට භික්ෂු සමාජය තුළ සැඟවුණු චරිත වූයේ නමුත් උන්වහන්සේලා හුදුකලාව වැඩ වාසය කරමින් සිය පැවිදි ජීවිත ඔපවත් කර ගැනීමට කටයුතු කළ බව අටුවා මූලාශ්‍රය විස්තරයන්ගෙන් පැහැදිලි වෙයි. රහතන් වහන්සේලා එකම අධිගමයක් ලබා සිටියේ නමුත් උන්වහන්සේලාගේ චරිත තුළ විවිධත්වයක් දක්නට ලැබෙන බව පෙනේ. එම විවිධත්වය මැනවින් හඳුනාගැනීමට හැකියාව ලැබී තිබෙනුයේ අටුවා මූලාශ්‍රය නිසාවෙනි. උන්වහන්සේලාගේ හැසිරීම් රටාවල සැබෑ ස්වරූපය අටුවා මූලාශ්‍රය ඒ ආකාරයෙන් ම වාර්තා කර ඇති හෙයින් උන්වහන්සේලාගේ චරිත ස්වභාවයන් මෙන්ම එම චරිත ගිහි පැවිදි සමාජය තුළ හැසිරුණු ආකාරය කවරේද යන්න මෙයින් අනාවරණය කරගත හැකිය.



## ආන්තික සටහන්

1. *"භික්ඛූනං සංඝො - භික්ඛුසංඝො. එත්තාවතා රාජා තීණි සරණං ගමනානි පටිවෙදෙසි"* <u>සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා,</u> (පඨමො භාගො) සංස්. ධම්මකිත්ති සිරි දෙවමිත්ත හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1918, පිටුව 160., 'බුද්ධ ශාසනයේ පැවිදි වූ පිරිස මෙනමින් හඳුන්වා ඇත. අටුවාචාරීන්ට අනුව භික්ෂුව යනු 'සසර භය දන්නා සුළු බව, පිණ්ඩාහාරයෙන් හෙවත් භික්ෂාවෙන් යැපෙන්නා, සිඳුණු බිඳුණු වස්ත්‍ර දරන්නා යන අර්ථයෙන්ගෙන් යුක්ත වෙයි; <u>සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා</u> (පඨමො භාගො), සංස්. බද්දේගම පියරතන හිමි, වැලිවිටියේ සොරත හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1929, පිටුව 169.,ඨ <u>දීඝනිකායට්ඨකථාවේ</u> සඳහන් වන ආකාරයට ධර්මය පිළිගත්, ප්‍රතිපත්ති ගරුක යමෙක් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනාව මැනවින් පිළිගත් සියලු දෙනා කෙරෙහි උපකාරීව වෙසේද හේ භික්ෂුව නම් වෙයි. *"භික්ඛවොති ධම්මපටිග්ගාහකපුග්ගලාලපන මෙතං ...... භගවතො හි අනුසාසනිං සංපටිච්ඡන්තෙසු භික්ඛු..........."* <u>සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා,</u> (දුතියො භාගො) සංස්. සිරි රේවත හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1925, පිටුව 543. මෙම සියලු විස්තරවලින් පැහැදිලි වනුයේ ගිහි භාවයෙන් වෙන්ව පැවිදි බ්‍රහ්මචාරී දිවි පෙවතකට යොමු වූ පිරිස මෙනමින් හඳුන්වා ඇති බවය. එම සමාජය උපසපන්, සාමණේර, විවිධ අධිගමයන් ලැබූ පිරිස ආදි වශයෙන් පුද්ගලයින් රැසකින් සමන්විත වෙයි.
2. <u>සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා,</u> (පඨමො භාගො), 1929, පිටුව 2.
3. <u>ඌනපූරණසහිතො මහාවංසො,</u> සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 37 - පිටු 221 - 222 - 223., "........... ඔහු මල් මහානාම නම් රජ දෙවිසි හවුරුද්දක් රාජ්‍යය කළේය. එකල බුද්ධඝෝෂ නම් අටුවා කතෘන් වහන්සේ දඹදිව සිට මේ ශ්‍රී ලංකාද්වීපයට වැඩ, බුදුන් වදාළ ............" <u>පූජාවලිය,</u> සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1997, පිටුව 778. මෙම මූලාශ්‍රවලින් පාළි අටුවා රචනා වූ අවධිය හා එය සිදුකළ ආකාරය පිළිබඳව පැහැදිලි වෙයි.
4. *"සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බාණතො ද්වින්නං වස්සසතානං උපරි ඡත්තිංසතිමෙ වස්සෙ ඉමස්මිං දීපෙ පතිට්ඨහිති වෙදිතබ්බො"* (සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස්හය වැන්නේ මේ දිවයිනෙහි පිහිටියේ යැයි දත යුතුය) <u>සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා,</u> (පඨමො භාගො) 1929, පිටුව 42

5. සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පි. 205. අට්ඨකථාව සඳහන් කරන ආකාරයට එම රහතන් වහන්සේ වැඩ සිටියේ අනුරාධපුර නගරාසන්නයේ තිබූ 'කන්තකසාල' පිරිවෙනේය.

6. "අරහන්තො ඡන්නවුති - කොටියො ථූපමුත්තමං" ඌනපූරණසහිතො මහාවංසො, 1959, පි. 166. පරි. 31. ගාථාව 95.

7. සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (තතියො භාගො) සංස්. විදුරුපොල පියතිස්ස හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1930, පිටුව 151.

8. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, සංස්. ධම්මකිත්ති සිරි ධම්මානන්‍ද හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, පිටු 219 - 220.

9. විසුද්ධිමග්ගො, සංස්. පමුණුවේ බුද්ධදත්ත හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1919, පිටුව 36. මහාසංඝරක්ඛිත හිමියන් වැඩ සිටි කුටියෙන් උපස්ථායක තෙරුන් වහන්සේ පිටතට යන විට ම උන්වහන්සේ රහත් බවට පැමිණ අසුර ගැසූහ. රැස් වූ සංඝයා වහන්සේලා මෙවැනි මරණාසන්න කාලයක ලෝකෝත්තර ධර්මය ඉපිද වූ ඔබවහන්සේ මහත් වූ දුෂ්කර දෙයක් කරන ලදැයි කීහ. ඇවැත්නි, මා මෙයට ද වඩා දුෂ්කර දෙයක් කියමි. "මා පැවිදි වූ තැන් පටන් සිහි නැතිව නුවණින් කළ වැඩක් ගැන නොදනිමි" යි කීය.

10. සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (පඨමො භාගො) සංස්. විදුරුපොල පියතිස්ස හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1924, පිටුව 211.

11. එම,

12. විසුද්ධිමග්ගො, 1919, පිටුව 92.

13. එම, පිටුව 16.

14. එම, පිටු 29 - 30.

15. එම, චිත්තගුත්ත නම් තෙරුන් වහන්සේ නමක් එක් පොහෝ දිනක බණ කියන විට පෝය ගෙයි පහන් සිල බලා තේජෝකසිණ නිමිත්ත උපදවාගත් බව කියයි. එම, පිටුව 126. මෙම තෙරුන් වහන්සේ කුරණ්ඩක ලෙන්වැසි චිත්තගුත්ත තෙරුන් වහන්සේම ද යන්න අටුවාවේ සඳහන් කර නැත. තවත් චිත්තගුත්ත තෙර නමක් පිළිබඳ විසුද්ධිමග්ගයේ ම 'පීතකසින' නිද්දේසයේ සඳහන් වෙයි. උන්වහන්සේ සිතුල්පව්වේ විසූ භික්ෂුවක් ලෙස එහි දක්වා ඇත. එම, පිටුව 127.



16. මහානිද්දෙසපාළි, (ඛුද්දක නිකාය) (දුතියො භාගො) සිංහල පරි. ලබුගම ලංකානන්ද හිමි, කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතය, 1961.

17. "පංසුකූලික, තෙචීවරික, පිණ්ඩපාතික, සපදාන චාරික, එකාසනික, පත්තපිණ්ඩික, ඛලුපච්ඡාභත්තික, ආරඤ්ඤික, රුක්ඛමූලික, අබ්භොකාසික, සොසානික, යථාසන්ථතික, නෙසජ්ජිකංගන්ති" ආදි වශයෙනි. විසුද්ධිමග්ගො, 1919, පිටු 45 - 59.

18. "ගතපච්චාගතවත" යනු කමටහන් ගෙන එය සිහිපත් කරමින් ගමන් කරන විට යම් අවස්ථාවකදී එය සිතින් බැහැරව ගියේ නම් එය දැනගත් විගස ආපසු හැරී ගොස් කමටහන් ගිලිහුණු තැන සිට නැවත භාවනාව පටන්ගෙන ඉදිරියට යාමයි. මෙම ව්‍රතය පිළිබඳව අටුවා මූලාශ්‍ර ගණනාවකම විස්තර කර තිබේ. "ගතපච්චාගතදූතනිද්දෙසෙ සො ගන්ත්වා පුන පච්චාගච්ඡතීති" සමන්තපාසාදිකා නාම විනයට්ඨකථාව, (පඨමො භාගො) 1929, පිටුව 322., පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, පිටුව 233., සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පිටුව 131.

19. පරමත්ථජෝතිකා නාම සුත්තනිපාතට්ඨකථා, සංස්. සූරියගොඩ සුමංගල හිමි, මාපලගම චන්දජෝති හිමි, කොළඹ: එස්. අන්ඩ්. එස්. ප්‍රින්ටර්ස්, 2010, පිටු 35 - 36. 'ගතපච්චාගතවත' වත යනු කුමක් ද 'ගෙනයෑම සහ ආපසු ගෙන ඒමයි.' ඇතැම් පැවිද්දෙක් ගෙනයති. ආපසු නොගෙනෙති. ඇතැම් පැවිද්දෙක් ගෙන එයි. එහෙත් ගෙන යන්නේ නැත. ඇතැම් පැවිද්දෙක් ගෙන නොයති. ආපසු ද නොගෙනෙති. ඇතැම් පැවිද්දෙක් ගෙන යති. ආපසු ගෙන යති. ගතපච්චාගත වතේ සාමාන්‍ය ස්වභාවයය එයයි. මේ ආදි වශයෙන් මෙම ව්‍රතය සිදු කරන ආකාරය පිළිබඳ දිගු විවරණයක් අටුවාවේ දක්වා තිබේ. මෙහි සඳහන් විස්තරයට අනුව මෙබඳු වත් සම්පූර්ණ නොකර පසේ බුදු බව ලැබිය නොහැකිය.

20. සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පිටුව 132.

21. පපඤ්චසූදනීනාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, පිටුව 232., සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පිටු 131 - 132., සම්මොහවිනොදනී නාම විභංගට්ඨකථා, සංස්. යගිරල පඤ්ඤානන්ද හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 1932, පිටුව 247., මෙම තෙරුන් පිළිබඳව සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (තතියො භාගො) 1930. පිටුව 154. ද සඳහන් වෙයි.

22. සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (තතියො භාගො) 1930. පිටුව 155., සම්මොහවිනොදනී නාම විභංගට්ඨකථා, 1932. පි. 247., සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පිටුව 132.

23. සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පිටු 132 - 133., මෙම කථා පුවත විභංගට්ඨකථාවේද ඒ ආකාරයෙන්ම සඳහන් වෙයි. නමුත් එහි සඳහන් කර ඇත්තේ 'ගලම්බුතිත්ථවිහාරයේ' වස් විසූ භික්ෂූන් පනස් නම ලෙසිනි. සම්මොහවිනොදනී නාම විභංගට්ඨකථා, 1932, පිටු 247 - 248., පපඤ්චසූදනීනාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, පිටුව 233., සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (තතියො භාගො) 1930. පිටුව 155.

24. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පි. 24. උන්වහන්සේ අටලොස් මහා ගණයාට ඉගැන්වූ බව සඳහන් වුව අටුවාවේ අටලොස් ගණය වශයෙන් හඳුන්වන්නේ කුමක්ද යන්න විස්තර කර නැත. එම නිසා ඒ සම්බන්ධයෙන් පැහැදිලි නිගමනයකට එළඹිය නොහැකිය.

25. විසුද්ධිමග්ගො, 1919, පිටුව 86.

26. එම,

27. සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, (දුතියො භාගො), සංස්. වැලිවිටියේ පේමරතන හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1945, පිටුව 456.

28. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (දුතියො භාගො). සංස්. ධම්මකිත්ති සිරි ධම්මානන්ද හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1943, පිටු 320 - 321.

29. සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා, (චතුත්ථො භාගො) සංස්. වැලිවිටියේ සොරත හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 1948, පිටු 986 - 987.

30. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) සංස්. ධම්මකිත්ති සිරි ධම්මානන්ද හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1923, පිටුව 21. මෙම කථා වස්තුව කිසිඳු වෙනසක් නොමැතිව සංයුත්තනිකායට්ඨකථාවේ ද සඳහන්ව තිබේ. සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (දුතියො භාගො) සංස්. විද්‍යුරුපොල පියතිස්ස හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1927, පිටුව 199.



31. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (චතුත්ථො භාගො) 1952, පිටුව 68.

32. විසුද්ධිමග්ගො, 1919, පිටුව 530.

33. එම, පිටුව 96.

34. එම, පිටුව 94.

35. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටුව 29.

36. විසුද්ධිමග්ගො, 1919, පිටුව 106.

37. සම්මොහවිනොදනී නාම විභංගට්ඨකථා, 1932, පිටු 346 - 347.

38. ඌනපූරණසහිතො මහාවංසො, 1959, පරි. 32. ගාථාව 52.

39. රසවාහිනී, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1961, පිටුව 154.

40. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, පිටුව 166.

41. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටුව 25.

42. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, පිටු 166 - 167.

43. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටුව 25.

44. ''පාදංගුලියා මහාපඨවිං පහරි.'' (පා ඇඟිල්ලෙන් මහපොළොවට පහර දුන්නේය) ''.................. *සොතාපන්නො අහන්ති වා සකදාගාමී අනාගාමී අරහා අහන්ති වා අධිමානො උප්පජ්ජති;''* (සෝවාන්, සකදාගාමී, අනාගමී හා රහතන් වහන්සේලාට අධිමානය උපදින්නේ නැත.) මෙහිදී ධම්මදින්න හිමියන් කුමන සිතුවිලිවලින් හැසිරුනේ ද යන්න කිව නොහැකිය. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) 1933, පිටුව 166.

45. ඌනපූරණසහිතො මහාවංසො, 1959, පරි. 32. ගාථාව 49. මෙහි එන සඳහනින් පෙනෙනුයේ උන්වහන්සේ සමන්ගිරි පර්වතයේ විසූ බවය. අටුවාවේ මලය දේශයේ විසූ බව කියයි. මූලාශ්‍රය තොරතුරු නිවැරදි බව මෙයින් තහවුරු වෙයි.

46. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටු 22 - 23.

47. එම,

48. බුද්ධදත්ත හිමි පොල්වත්තේ, අටුවාපරීක්ෂණය හා අටුවාකථාවස්තු, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2009, පිටුව 68.

49. එම,

50. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (චතුත්‍ථො භාගො) 1952, පිටු 219 - 220.

51. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටුව 23.

52. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (චතුත්‍ථො භාගො) 1952, පිටු 219 - 220.

53. ජාතකට්ඨකථාව, (සත්තමො භාගො) සංස්. විදුරුපොල පියතිස්ස හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණය, 2010, පිටුව 25.

54. ඌනපූරණසහිතො මහාවංසො, 1959, පරි. 32. ගාථාව 53. මෙහිදී උන්වහන්සේගේ නම 'බුද්ධතිස්ස' යනුවෙන් හඳුන්වා තිබේ.

55. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටු 384 - 385.

56. ජාතකට්ඨකථාව, (සත්තමො භාගො) 2010, පිටුව 25.

57. ඌනපූරණසහිතො මහාවංසො, 1959, පරි. 32. ගාථාව 53.

58. බුද්ධදත්ත හිමි, එම, 2009, පිටු 71 - 73. .

59. වංසත්‍ථප්පකාසිනී නාම මහාවංස ටීකාව, සිං. අනුවාදය, අකුරටියේ අමරවංස හිමි, හේමචන්ද්‍ර දිසානායක, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1994, පිටුව 485.

60. මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (පඨමො භාගො) 1923, පිටුව 384.

61. එම,

62. අත්‍ථසාලිනී නාම ධම්මසංගණිප්පකරණට්ඨකථා, සංස්. යගිරල පඤ්ඤානන්ද හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ මුද්‍රණාලය, 1940, පිටුව 332.



63. සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (පඨමො භාගො) 1918, පිටුව 132., සම්මොහවිනොදනී නාම විභංගට්ඨකථා, 1932, පිටුව 247., පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (පඨමො භාගො) පිටුව 233. මෙම අටුවා තුනේදී ම මෙම තෙරුන් වහන්සේ පිළිබඳ කථා පුවත් සඳහන් වන අතර ඒ හැම තන්හී ම උන්වහන්සේ විසින් පුරන්නට වූ 'ගතපච්චාගතවත' පිළිබඳ සඳහනක් වෙයි. මෙම වත සමාදන් වූ බොහෝ භික්ෂූන් වහන්සේලා රහත් බවට පත් වූ ආකාරය මෙහිදී විවරණය වෙයි. මෙම වත ධ්‍යානයකට සමවැදීම ලෙසින් අර්ථගැන්විය හැකි අතර තමන් එළඹුණු ධ්‍යානය කඩ නොකොට සිය අරමුණ සඵල වන තෙක් දැඩි අධිෂ්ඨානයෙන් වාසය කිරීම මෙයින් සිදු කර තිබේ.

64. පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා, (දුතියො භාගො) 1943, පිටුව 244

65. එම, පිටු 244 - 245 - 246. මෙම තෙරුන් වහන්සේ බුදුන් දවස සිටි සච්චක නිඝණ්ඨයා බවත් බුදුන් වහන්සේ ඔහුට දහම් දෙසුවේ අනාගතයේදී මෙරට පැවිදිව රහත්වන බව දැනගෙන බවත් අටුවාවේ සඳහන් වෙයි.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
22 FEB 2016
පුස්තකාලය